# නවංග සත්ථු සාසනය හා ඒ පිළිබඳ බුද්ධඝෝස හිමියන්ගේ විවරණය

*මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ*

බුද්ධඝොස හිමි සමන්තපාසාදිකාවේදී බුද්ධවචනය පිළිබඳ වර්ගීකරණයක් කරමින් එයින් එක් වර්ගයක් ලෙස නවංගසත්ථුසාසනය ඉදිරිපත් කරයි [1]. බුද්ධ වචනය අංග නවයකට බෙදීම අට්ඨකථා යුගයට වඩා බොහෝ පැරණි බවට සාධක වශයෙන් ඒ නවංගය (අංග නවය) මජ්ඣිම නිකාය[2]. සහ අඞ්ගුත්තර නිකාය[3] යන සුත්ත පිටකයට අයත් ග්‍රන්ථ දෙකේ සඳහන්ව ඇති බව මෙහිදී සැලකිය යුතුය. අංග නවය සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම හා වෙදල්ල යනුවෙන් දැක් වෙයි. මහාවිහාර අට්ඨකථා සම්ප්‍රදය අනුගමනය කළ බුද්ධඝොස හිමි මේ අංග හඳුන්වා දී ඇති ආකාරය පිළිබඳ ගැටළු තිබේ. එනිසා එම හඳුන්වා දීමත් ඒතුළින් මතු වන ගැටළුත් මෙහිදී විමසා බලනු ලැබේ.

## 1. සුත්ත අංගය

සුත්ත යන්න ඇසෙන හෝ දකිනවිටම අපේ සිහියට එන්නේ සුත්ත පිටකයයි. මුළු පිටකයක්ම සුත්ත නමින් හඳුන්වා ඇති විට එය තුළ සුත්ත නොවන කිසිවක් තිබිය නොහැකියයි තර්ක කිරීමට ඇති ඉඩකඩ කෙරෙහි සැලකිල්ලක් නොදක්වීමට පුළුවන් කමක් නැත. එහෙත් සුත්ත පිටකය සුත්ත අංගයට අයත් බවක් බුද්ධඝොස හිමි නොකියයි. ඒ වෙනුවට මුළු විනය පිටකයත්, සුත්ත නිපාතයේ 13,16,37,52 සූත්‍රත්, සුත්ත නමින් හැඳින්වෙන අනිත් බුද්ධවචනත් සුත්ත අංගයට අයත් බව උන්වහන්සේ කියති[4]. මේ විග්‍රහයට අනුව පාරාජිකාපාලි, පාචිත්තියපාලි, මහාවග්ග, චුල්ලවග්ග හා පරිවාරපාලි යන ග්‍රන්ථ පහෙන් විනය පිටකය සමන්විත වී තිබේ. එහෙත් එය සුත්ත පිටක යනුවෙන් හඳුන්වා නැත.

විනය පිටකයක් වශයෙන් වර්ධනය වූයේ ප්‍රථම සංගායනාවටත් තුන්වෙනි සංගායනාවට ආසන්න පසුකාලයටත් අතර කාලයේදීය. එහි ප්‍රථම ග්‍රන්ථ වන පාරාජිකා පාලි සහ පාචිත්තිය පාලි යන ග්‍රන්ථ දෙක පොදුවේ හැඳින්වෙන්නේ සුත්තවිභංග යනුවෙනි. සුත්ත හා විභංග යන වචන දෙක සමාස කොට මේ වචනය තනාගෙන තිබේ. විභංග යන්න සංවර්ණනය හෙවත් විවරණය යන අර්ථය සඳහා යොදන ලද්දකි. එම සංවර්ණනය හෙවත් විවරණය සුත්ත නමින් වූ බුද්ධවචන විශේෂයක් සඳහා කරන ලද්දකි. 'එත්තකං තස්සභගවතො සුත්තාගතං



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

සුත්තපරියාපන්නං'[5] යන ප්‍රකාශය විනය සුත්ත ගණයට අයත් බවට දිගු කලෙක සිට පැවති සම්ප්‍රදයක් කෙරෙහි අපේ අවධානය යොමු කරයි. පරිවාරපාලියේ එන '..... සුත්තෙ දිස්සන්ති...'[6] යන ප්‍රකාශයද එම සම්ප්‍රදය නැවත සිහිගන්වන්නකි. විනය පිටකයේ ප්‍රභවයට උල්පත වූ පෞරාණික විනය නීතිමාලාව සුත්ත නමින් හැඳින්වූ බවයි මෙයින් අනාවරණය වන්නේ. එම නීති මාලාවට විනය නීති 152 ක් අයත්ව තිබුණු බවට සාධක නිකාය ග්‍රන්ථවලම දක්නට ලැබේ [7]. එහෙත් බුද්ධඝොස හිමි ශික්ෂාපද 150ක් ලෙස ගෙන ඇති අතර එම සංඛ්‍යාව මිලින්ද පඤ්හයේ ද එයි. අඞ්ගුත්තර නිකායේ එන පරිදි බුදුන්වහන්සේ ශ්‍රාවකයන් සඳහා ශික්ෂාපද පැනවූහ. නමුත් වඩාත් පැරණි කිසිම නිකාය ග්‍රන්ථයක බුද්ධකාලයේ පැවති විනය නීතිමාලාව සුත්ත නමින් හඳුන්වන ලද බවට සාධක නැත. සමහරවිට ප්‍රථම සංගායනාවේදී එවකට පැවති විනය නීති මාලාව සුත්ත යනුවෙන් හඳුන්වන්නට ඇතැයි අනුමාන කිරීමට සුත්තවිභංග යන නාමය අනුබල දෙයි. ඒ කාලයේ සුත්ත පිටකයක් පිළිබඳ අදහසක්ද නොවූ බව අද සුත්ත පිටකයට අයත් ග්‍රන්ථ ප්‍රථම සංගීතියේදී නිකාය හෙවත් ආගම* යනුවෙන් හඳුන්වා තිබීමෙන් අනාවරණය වෙයි.

සුත්ත යන අංගය ගැන බුද්ධඝොස හිමි කරන විස්තරයට අනුව එය දීඝ, මජ්ඣිම, සංයුත්ත හා අඞ්ගුත්තර යන නිකාය හතරටද සාධාරණ වන බව ඒ හිමියන් පිළිගෙන තිබුණ බවට සාධක තිබේ. ඒ අනුව උන්වහන්සේ දීඝනිකායේ 34ක්ද, මජ්ඣිමනිකායේ 152ක්ද, සංයුත්තනිකායේ 7762ක්ද, අඞ්ගුත්තර නිකායේ 9557ක්ද සුත්ත ඇති බව පැවසීමෙන් හා සුත්ත නාමයෙන් හැඳින්වෙන බුද්ධ වචන ද සුත්ත අංගයට අයත් සේ සලකනු ලබන බව පැවසීමෙන්ද සනාථ වෙයි.[8] මේ අනුව බලන විට මුළු විනය පිටකයත්, සුත්ත පිටකයේ මුල් ග්‍රන්ථ හතරත් ඛුද්දක නිකායේ සුත්තනිපාතයේ 13,16,37,52 සූත්‍රත් සුත්ත අංගයට ගෙන තිබේ. නවංග අතුරෙන් විශාලම අංගය සුත්ත බව මෙයින් පැහැදිලි වෙයි.

ක්‍රි.ව. 5 වෙනි ශතවර්ෂයේදී සුත්ත අංගය පිළිබඳව මහාවිහාරයේ පැවති විග්‍රහය බුද්ධඝොස හිමියන්ගේ විග්‍රහයට වෙනස් නොවීය. කිසිවකු විසිනුත් ඒ පිළිබඳව වෙනස් මතයක් ඉදිරිපත් කර තිබූ බවක් සඳහන් නොවීමෙන් එය එසේ සකස් නිගමනය කිරීම සාධාරණ වෙයි.

සුත්ත පිළිබඳව ඉහත සඳහන් විග්‍රහයට නවංග මුලින්ම හඳුන්වා දෙන ලද කාලයට මෙන්ම බුද්ධ පරිනිර්වානයට පසු කාලයට සමහර විට පරිවාර පාලිය රචනා වූ ක්‍රිස්තුවර්ෂාරම්භයට ආසන්න යුගයට අයත් ග්‍රන්ථ ද ඇතුළත් කළ හැකි වී තිබේ. මේ ලක්ෂණය අනික් අංග සමහරකටද ඒ ආකාරයටම වලංගුය.

## 2. ගෙය්‍ය අංගය

ගද්‍ය හා පද්‍ය මිශ්‍ර සූත්‍ර ගෙය්‍ය නම් වෙයි. මේ අංගයට නිදසුනක් වශයෙන් බුද්ධඝොස හිමියන් විසින් දී ඇත්තේ සංයුත්ත නිකායේ සගාථක වග්ගයයි.[9] සුත්ත අංගය තුළ ගෙය්‍ය අංගයද ඇති බව මෙයින් අනාවරණය වෙයි. අංග නවයට පොදු වූ පදනමක් නැති බව ද මෙයින් සනාථ වෙයි. ගෙය්‍ය සාහිත්‍යයමය ලක්ෂණයකි. නිර්මාණාත්මක මාධ්‍යය පිළිබඳ අගයකි එහි ඇත්තේ. සංස්කෘත නිර්මාණ සාහිත්‍යයෙහි

* සර්වාස්තිවාදීහු එම ග්‍රන්ථ ආගම නමින් හඳුන්වති.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

චම්පූ වර්ගයට එය සමානය. පැරණි ජනකතාවල ගද්‍ය මෙන්ම පද්‍යයද යොදගෙන තිබුණා විය හැකි අතර විචිත්‍රත්වයක් කතන්දරයට එක් කිරීමට එය සමත් විය. එහෙත් සුත්ත යන්න නූල යන අර්ථය ඇති වචනයක් වශයෙන් ගත් විට ප්‍රස්තුත සන්දර්භයේ දී එයින් ගම්‍යමාන වන්නේ විනය නීති මාලාවකි. එහි නිර්මාණාත්මක වැදගත්කමක් නැත.

## 3. වෙය්‍යාකරණ අංගය

බුද්ධඝොස හිමි වෙය්‍යාකරණ අංගය විස්තර කරන්නේ ගද්‍යමය විවරණ ලෙසිනි[10]. පද්‍යරහිත සියළු බුද්ධවචන එයට අයත් බව උන්වහන්සේ කියයි. ඒ අනුව මුළු අභිධර්ම පිටකය මේ අංගයට අයත් වෙයි. ඊට අමතරව ගාථා රහිත සුත්තද, විශේෂයෙන් ධම්මචක්කප්පවත්තන සූත්තය වෙය්‍යාකරණ ගණයට අයත්ය. සුත්ත යන අංගය තුළ වෙය්‍යාකරණ ද ඇති බව ද මෙයින් අනාවරණය වෙයි. ඊටත් වඩා අනිත් අංග අටට අයත් නොවූ බුද්ධවචන මේ අංගයට ගැණෙන බවට බුද්ධඝොස හිමියන් කරන ප්‍රකාශයෙන් වෙය්‍යාකරණ අංගයට නිශ්චිත වටිනාකමක් නැත. අනිත් අංග අයත් නොවූ දේ අතර වෙය්‍යාකරණද නොවන අංග තිබිය හැකිය. මහාව්‍යුත්පත්තියෙහි (62) අංග දොළහේ ලයිස්තුවක් ඇති බව මෙහිදී සිහියට නැගෙයි. අංග නවයට සීමා වීමේ අපහසු බවක් ඇති වී එසේ දොළහක් හඳුන්වා දුන්නා විය යුතුයි.

## 4. ගාථා

ගාථා අංගය පිළිබඳව බහුල ව්‍යවහාරයෙහි පැනෙන හෙයිනුත් අවුල් සහගත තත්ත්වයක් නොමැති හෙයිනුත් මෙහිලා විස්තර කිරීම අවශ්‍ය නොවේ.

## 5. උදාන අංගය

උදාන නමින් ග්‍රන්ථයක් ඛුද්දක නිකායේ තිබේ. නවාංග ගැන බුදුන්වහන්සේ කථා කළ කාලයේ එවැනි ග්‍රන්ථයක් වී යයි කිව නොහැකිය. ප්‍රීතිවේගයෙන් උතුරාගිය භාවගීත ගණයේ නිර්මාණ උදාන පාලියේ පමණක් නොව සූත්‍ර පිටකයේ වෙනත් ග්‍රන්ථවල ද වෙයි. ථෙරගාථා, ථෙරීගාථා යන කෘති විශේෂයෙන් සඳහන් කළ හැකිය.

## 6. ඉතිවුත්තක අංගය

'වුත්තංහෙතං භගවතා......' යන වාක්‍යයෙන් පටන්ගන්නා බුද්ධවචන ඇතුළත් ඉතිවුත්තකය මේ අංගයට අයත්ය. නවංග ගැන මුලින්ම කථා කළේ බුදුන්වහන්සේ බව මීට පළමුව පෙන්වා දුනිමි. ඒ අවස්ථාවේ ඉතිවුත්තක නමින් කෘතියක් තිබීමට කිසිදු ඉඩක් නැත. ඉතිවුත්තක යන්නේ පැරණි අර්ථය අමතක වී ගියාට පසුව හා ඛුද්දක නිකායේ ඉතිවුත්තක නමැති ග්‍රන්ථය රචනා වූවාට පසුව එම ග්‍රන්ථය ඉතිවුත්තක අංගය ලෙස හැඳිනගෙන ඇති බවයි මෙයින් පෙනෙන්නේ.

## 7. ජාතක අංගය

දීඝනිකායේ[11] ඇති ජාතක කථා හා ජාතකපාලි නමින් ඛුද්දකනිකායට අයත් කෘතියක්ද ජාතක කථා 547 ක සංග්‍රහයක් ද වෙයි. බුද්ධඝොස හිමි කියන්නේ 550



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

ක් වූ ජාතක කථා සංග්‍රහය මේ අංගයට අයත් බවයි. අනික් දෙක විශේෂයෙන් පෙළේම එන ජාතක කථා මේ අංගයට ඇතුළත් කර නැත. බුදුන් වහන්සේගේ කාලයට අයත් උන්වහන්සේ දේශනා කළ සූත්‍රවල තිබෙන ජාතක කථා ජාතක අංගයට අයත් සේ පිළිනොගෙන පසු කාලයක පිළියෙළ කරන ලද ජාතකකථා සංග්‍රහයක් ජාතක අංගයෙන් අදහස් වන බව පැවසීම සැබවින්ම අශාස්ත්‍රීය කියමනකි.

## 8. අබ්භුතධම්ම අංගය

ආශ්චර්යය අද්භූත ධර්ම ප්‍රතිසංයුක්ත සූත්‍ර අබ්භූත ධම්ම අංගයට අයත් යයි බුද්ධඝොස හිමි කියයි. නිදසුනක් වශයෙන් දීඝනිකායේ[12] එන "චත්තාරොමෙ භික්ඛවේ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ.." යන්න ඉදිරිපත් කරනු ලැබේ[13]. මෙය වෙනම සූත්‍රයක් නොව මහාපරිනිබ්බාන සූත්‍රයේ එන ප්‍රකාශයකි. එවැනි ප්‍රකාශ සහිත සූත්‍ර මේ අංගයට අයත් සේ සැලකූ බවයි මෙයින් ඇඟවෙන්නේ. මෙම විවරණයට අනුව අබ්භුතධම්ම සුත්ත අංගය තුළ තිබෙන බව පිළිගැනීමට සිදු වෙයි.

## 9 වේදල්ල අංගය

"වේදයත් සතුටත් ලබමින් විචාරණ ලද සූත්‍රාන්ත" වේදල්ල ගණය අයත් වෙයි.[14] වේද යන්නෙන් ඥානය අදහස් වෙයි. මෙහි අනික් ලක්ෂණය සතුටයි. උදානයකද එම ලක්ෂණය දැකිය හැකිය. වේදල්ල අංගයට අයත් සූත්‍ර හයක් නම් කොට තිබේ. එයින් දෙකක පමණක් වේදල්ල යන්න සඳහන් වෙයි. ඒ අනුව වේදල්ල යනුවෙන් ඒ සූත්‍ර හඳුන්වා ඇතැයි පිළිගත හොත් වේදල්ල යන්න ඇතුළත් නැති අනෙක් සූත්‍ර හතර වේදල්ල විය නොහැකියයි කීමට සිදු වෙයි. ඉතිවුත්තක යන අංගයෙහි ක්‍රමයට වේදල්ල හඳුනාගෙන නැති බවයි එයින් වැඩිදුරටත් සනාථ වන්නේ. මේ අනුව නම් කර ඇති සූත්‍ර හයේම පොදු ලක්ෂණයක් සලකා වේදල්ල යන නමින් ඒවා හඳුන්වා ඇති බවයි පෙනීයන්නේ. එම පොදු ලක්ෂණය ඥානයත් සතුටත් ලබමින් විචාරණ ලද සූත්‍ර වීම බව බුද්ධඝොස හිමියන්ගේ පිළිගැනීමයි.

මහා ව්‍යුත්පත්තියෙහි (62) නවංගය වෙනුවට අංග දොළහක ලයිස්තුවක් එයි. එම ලයිස්තුවේ වේදල්ල අංගය වෙනුවට වෛපුල්‍ය අංගය එයි. මේ නිසා වේදල්ල යන්න වෛපුල්‍ය යන්න සමග සසඳා දෙකටම පොදු අරුතක් තිබේදැයි සොයා බැලිය යුතුව ඇත. වේදල්ල යන ප්‍රාකෘත ව්‍යවහාරය වෛද්‍යාය්‍ය යන සංස්කෘත වචනයෙන් බිඳුනක් ලෙස ගැනීමට ඉඩ ඇතත් මහා ව්‍යුත්පත්තියෙහි වෛපුල්‍ය යනුවෙන් යොදා තිබීම එයට බාධාවකි.[15]

## අනෙක් බෙදීම් සමග සැසඳීම

බුද්ධකාලයේම පැවති තවත් බෙදීම් කීපයක්වෙයි. ධම්ම විනය වශයෙන් දෙවැදෑරුම්ය යන්න ඉන් එකකි. මහා පරිනිබ්බාන සූත්‍රයේ ධම්මොච විනයොච යනුවෙන් බුද්ධවචනවර්ග දෙකක් පැවති බව සඳහන් වෙයි. ප්‍රථම සංගායනාව ගැන විස්තර කරන එහෙත් එම සංගායනාවට පසුව ලියන ලදයි සැලකිය යුතු චුල්ලවග්ග පාලියේද මේ දෙවැදෑරුම් බෙදීම අනුව සංගායනාව පැවැත් වූ බව



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

වාර්තා වෙයි. එහෙත් ප්‍රථම සංගීතියේ සාහිත්‍යය ධම්ම විනය යනුවෙන් කොටස් දෙකක් පිළියෙල නොකර නිකාය පහක් වශයෙන් පිළියෙළ කළ බව එහි වැඩි දුරටත් වාර්තා වෙයි. මේ වර්ගීකරණය අනුව නිකාය වශයෙන් පංචවිධ බවට සම්ප්‍රදායක් ඇති විය. එනිසා ප්‍රථම සංගීතිය අවසානය දක්වාම පැහැදිලිවම බුද්ධවචනය අංග නවයකට හෝ ධම්ම හා විනය වශයෙන් හෝ බෙදා පරිහරණය කළ බව සනාථ නොවෙයි. පසු කලෙක ඇති වූ පිටකවලට වෙන් කිරීම අවසාන සාර්ථක ප්‍රයත්නය වී තිබේ. බුද්ධ වචනය ප්‍රථම සංගීතියේදී නිකාය පහකට බෙදා දක්වීම හා එය පදනම් කර ගෙන පසුව ත්‍රිපිටකය සංවර්ධනය වීම ඇත්ත වශයෙන්ම සිදු වූ දෙය ලෙස භාර ගැනීමට අපහසුවක් නැත.

බුද්ධවචනය අංග නවයකට බෙදා දක්වීමට නොහැකි වූයේ ඇයිද? යන්න ගැටළුවකි. බුදුන් වහන්සේ විසින්ම තමන් වහන්සේගේ ඉගැන්වීම අංග නවයකින් සමන්විත බව ප්‍රකාශ කර තිබෙන බව කලින් පෙන්වා දුනිමි. ඒවා කිසිදක වෙන් වෙන් වශයෙන් පැවති නැත. එසේ වුවද ඒ අංග බුද්ධවචනය තුළ ඇති බව පිළිගෙන තිබුණ බව පෙනීයයි. ප්‍රථම සංගායනාව අවස්ථාවේ එම අංග නවයට බුද්ධවචනය බෙදීමට උත්සාහයක් දරා නොතිබීමෙන් එය නොකළ හැක්කක් බව වටහාගෙන තිබුණ බව අනාවරණය වෙයි. කාලයාගේ ඇවෑමෙන් මේ අංගවල නියම ස්වරූපය ශ්‍රාවකයන්ගේ මතකයෙන් ගිලිහී ගියා විය යුතුයි. අට්ඨකථා යුගයේදී ඒ අංග විස්තර කිරීම ගැටළුවක් වන්නට ඇත. සාම්ප්‍රදයික වශයෙන් පිළිගත් ආකාරයට ඒවා විස්තර කිරීමෙන් සෑහීමට පත් වීමට අට්ඨකථාචාරීන් වහන්සේලාට සිදුවිය. මේ තත්වය යටතේ නවංග බෙදීම විස්තර කිරීමේදී ව්‍යාකූලත්වයක් ඇති වී තිබේ. එක් අංගයක් තුළ තවත් අංගයක් හෝ අංග තිබීම වැනි ගැටළු නොවිසඳී දිගටම පවතිනු ඇත.

**පාදක සටහන්**

1. සමන්ත පාසාදිකා (පීටීඑස්), I, 27,28 පිටු.
2. මජ්ඣිමනිකාය (පීටීඑස්.) I, 133 පි.
3. අඞ්ගුත්තර නිකාය, (පීටීඑස්.) II, 103 පි.
4. සමන්තපාසාදිකා, පෙසමු , I, 27පි.
5. පාතිමොක්ඛ, ආර්. ඩී. වඩේකාර් සංස්කරණය, පූනා, 1939 54පි.
6. පරිවාර පාලි, 1905, 121පි.
7. Vinternitz M. History of Indian Literature, II, 23 පි.
8. සමන්තපාසාදිකා, පෙසමු, I, 27- 28 පිටු.
9. එම., 28පි.
10. එම
11. දීඝනිකාය (පීටීඑස්.) I, 127, II, 220 සිට
12. එම, II, 145 පි.
13. සමන්තපාසාදිකා, පෙසමු, 28පි.
14. එම, 28-29 පිටු.
15. විස්තර සඳහා බලන්න, මහාචාර්‍ය ඇන්. ඒ. ජයවික්‍රම, 'බුදුගොස් හිමි හා පාළි ත්‍රිපිටකයේ පරම්පරාගත වර්ග කිරීම' ධාරා, 10, 13 - 35 පිටු.



ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk